# 4 ශ්‍රේණිය සිංහල
# ගුරු අත් පොතට
# වැඩ පොත - අංක 06

## L3, S3, R3, W3

## නිපුණතා ආවරණය - 2021

Part ii



සරල ජේදයක් ළමා කවි, ගීතවලට සවන් දී ඒ පිළිබඳ ව කතා කරයි.

- ළමා කතන්දර, සංවාදවලට සවන් දී එහි අන්තර්ගතය ප්‍රකාශ කරයි.
- චරිතය පිළිබඳ අවබෝධයෙන් යුතු ව කතා කිරීමේ කුසලතාව ප්‍රදර්ශනය කරයි.
- ළමා කවි, ගීත, කතන්දර හා සංවාද කියවා ප්‍රශ්නවලට පිළිතුරු දෙයි.
- චරිතයකට ආරෝපණය වී අවබෝධයෙන් යුතුව කියවයි./ලියයි.
- චිත්‍ර කතා කියවා, නිර්මාණශීලී දෙබස් ලියයි.

**සැකසුම - හසිත හෙට්ටිආරච්චි**

(Dip. In Sci. N.I.E./O.U.S.L.)

For Online Class details WhatsApp 071-9020298

# සංවාද

- පහත සඳහන් සංවාදය කියවා අසා ඇති ප්‍රශ්න වලට පිළිතුරු ලියන්න.

## පිට්ටු බම්බුව

ගමරාල : හාමිනේ මෙහෙට ඇවිත් වාඩි වෙන්න කෝ. දූන් ඉතිං අපේ දරුමල්ලොත් දීගතල දීලා ඉවර එකේ අපිට මොන කරදරයක් ද මන්ද හාමිනේ ?

ගම හාමිනේ: ඒක නම් ඇත්ත තමයි. පිනක් දහමක් කරගෙන අපි දෙන්නට සතුටින් ඉන්න එක තමයි තියෙන්නේ.

ගමරාල : හාමිනේ . . . ඒක නෙමේ, මේ අහන්නකෝ. මට මේ ළඟක දී ඉඳලා පුදුම ආසාවක් ඇති වෙලා තියෙනව නේ.

ගම හාමිනේ: හැබෑට, ඒ මොකක් ද ගමරාල ?

ගමරාල : පිට්ටු කන්න.

ගම හාමිනේ: පිට්ටු කන්න ආසාවක් ඇති වුණාට පිට්ටු තම්බන්නේ කොහොම ද ? පිට්ටු බම්බුවක් එපා යැ.

ගමරාල : ඕකත් මහ කාරියක් යැ. අහල ගමේ ගමරාල ළඟ තියෙනවා නොවැ හොඳ පිට්ටු බම්බුවක්. මම ගිහිල්ලා අරන් එන්නම්.

ගම හාමිනේ: ඉතිං ඕක ගේන්න ඔය ඇත්තට තකහණියෙ ම අල්ලපු ගමට යන්න පුළුවනෑ.

ගමරාල : අපෝ. පිට්ටු තැම්බෙනව නම් ඕකත් මහ කාරියක් යැ හාමිනේ. හාමිනේ අවශ්‍ය කළමනා ටික ලෑස්ති කර ගන්න. මම ගිහිං පිට්ටු බම්බුව ඉල්ලගෙන එන්නම්.

ගම හාමිනේ: ගමරාල එන්න කලිං කුරහන් ටික එහෙම අඹරලා ලෑස්ති කර ගන්න ඕනේ. ආ . . . ගමරාල හොයලා දාපු දර ටික ලිප ළඟට කිට්ටු කර ගන්නත් එපායැ.

ගමරාල : ඔන්න හාමිනේ මම පිට්ටු බම්බුව අරං ආවා.

ගම හාමිනේ: ඔන්න ගමරාල පිට්ටු තැම්බුවා රස ද බලන්න.

ගමරාල : යස අගේ ඇති පිට්ටු ටික. අම්මෝ මගේ බඩ හොඳට ම පිරිලා. මම නම් ටිකක් වැල් ඇඳේ හාංසි වෙනවා හාමිනේ. ආ . . . ඒක නෙවේ පිට්ටු නම් කාපි. දූන් කවුද පිට්ටු බම්බුව ගෙනිහින් දෙන්නේ.

ගම හාමිනේ: ගෙනාවේ ඔහේ නෙව. ඔහේ ම ගෙනහුන් දෙන එක යි ඇත්තේ.

ගමරාල : මම ? මම ගෙනාව නම්, ගෙනහුන් දෙන්න ඕන ඔහේ නෙව ?

ගම හාමිනේ: මම මොකට ද ගෙනියන්නේ ? ඔහේ බම්බුව ගෙනාවට මම නොවැ පිට්ටු තැම්බුවේ. ගේන එක අමාරුවක් යැ. පිට්ටු තම්බන එක නේ අමාරු කාරිය. ඒක නිසා ඔහේ ම ගෙනහුන් දෙන එකයි ඇත්තේ.

ගමරාල : මේක හරි ම අසාධාරණ කතාවක් නොවැ. මම'යි දර ටික හොයලා දුන්නෙත්, කුරහන් ටිකෙන් බාගයක් අඹරලා දුන්නෙත්. මම නම් කීයටවත් ඕක ගෙනහුන් දෙන්නේ නැහැ.

ගම හාමිනේ: හා හොඳයි. මම හොඳ විසඳුමක් දෙන්නම්. ඔහෙයි මායි මේ දූන් ඉඳන් කතා නොකර ඉමු. ඉස්සෙල්ල ම කතා කරපු කෙනා පිට්ටු බම්බුව ගෙනහුන් දෙන්න ඕනේ.

ගමරාල : හා හොඳයි. ඒ යෝජනාවට මමත් එකඟ යි. හාමිනේ අර දොර මුල්ලට යන්න මම මේ දොර මුල්ලට යන්නම්.

ගම දුව : මම ගෙදර ආවේ හුඟ දවසකින්. අම්මයි අප්පච්චියි සනීපෙන් ද දන්නැහැ. ගෙදර දොරවල් නම් ඇරල වගේ.

අම්මේ . . . අම්මේ . . .

අප්පච්චි . . . අප්පච්චි . . .

කොහේ ගිහින් ද මේ දෙන්නා දොරවලුත් ඇර දාලා. සමහර විට වතුපිටිවල වැඩ ද දන්නැහැ. වත්ත පහළට ගිහිං බලමු. ම් . . .ම් . . . මේ පැත්තෙත් නැහැ නේ. අම්මේ . . . අප්පච්චි . . .

ගම හාමිනේ: අනේ අපේ පොඩි දුව ඇවිල්ලා වගේ. ඒත් ඉතිං කට අරින්න බැහැ නේ.

ගමරාල : දුව අපිව හැමතැනම හොයනවා වගේ. ඒත් . . . මම නම් කට අරින්නේ නැහැ.

ගම දුව : අම්මයි අප්පච්චියි කොහේ වත් නැහැ වගේ. ආයෙමත් ගිහින් ගේ ඇතුළේ වත් බලමු. කොහේ හරි වැටිල වත් ද? ආ . . . මේ ඉන්නේ අප්පච්චි දොරමුල්ලේ. අම්මත් මේ ළඟම ඇති. අනේ මේ ඉන්නේ අම්මා. අනේ අම්මේ කතා කරන්නකෝ . . . අප්පච්චී මේ මොක ද ඔය දෙන්නට වෙලා තියෙන්නේ ? දෙන්නට ම කතා කරන්න බැහැ වගේ.

අනේ මගේ අම්මයි, අප්පච්චියි බේරලා දෙන්න. අනේ අම්මේ කතා කරන්නකෝ. මොකද මේ වුණේ ? අප්පච්චි කියන්නකෝ මොකද කතා කරන්නේ නැත්තේ ?

මේ දෙන්නට කට්ටඩියෙක් ගෙනල්ලා හොඳ තොවිලයක් කරන්න වෙයි වගේ. එහෙම වත් කරලා බලමු.

කට්ටඩියා : හොඳයි. දූන් රැයක් පුරා තොවිල් නැටුවා. දූන් ඉතිං කතා කරමු හොඳයි. නැත්නම් මම තුඹව කතා කරවන හැටි දන්නවා. කට්ටඩිරාල දෑත් බඳලා පන්දමෙන් පහරක් ගමරාලට ගැහුවා.

ගමරාල : බුදු අම්මෝ ගහන්න එපෝ. මට පිට්ටු බම්බුව ගෙනියන්න බැරියෝ . . .

1. ගමරාලට ඇති වූ ආශාව කුමක් ද ?

.....................................................................................................................................

2. ගමරාල පිට්ටු බම්බුව ගෙනාවේ කොහෙන් ද ?

.....................................................................................................................................

3. ගමරාල සහ ගමහාමිනේ අතර වාදයක් ඇති වුයේ කුමක් නිසා ද ?

.....................................................................................................................................

4. සංවාදය සම්පූර්ණ කරන්න.

ගමරාල : හාමිනේ මට මේ ළඟක දි ඉඳන් පුදුම ආසාවක් ඇතිවෙලා තියෙනවා.

ගම හාමිනේ : .......................................................................................................

ගමරාල : පිට්ටු කන්න.

ගම හාමිනේ : .......................................................................................................

.....................................................................................................................................

ගමරාල : එහා ගමේ ගමරාල ළඟ තියෙනවා හොඳ පිට්ටු බම්බුවක්. මම ගිහිං අරගෙන එන්නම්.

ගම හාමිනේ : ඕකට ඉතිං මේ හදිස්සියෙ ම යන්න පුළුවනි ද?

ගමරාල : ...........................................................................................................

.....................................................................................................................................

.....................................................................................................................................

ගමහාමිනේ : එතකල් මම කුරහන් අඹරන්නම්. ගමරාල හොයල දාපු දර ටික ලිප ළඟට ගන්නම්.

ගමරාල : ..........................................................................................................

ගමහාමිනේ : ඔන්න පිට්ටු තැම්බුවා. රස ද බලන්න.

ගමරාල : අගේ ඇති පිට්ටු ටික. කවුද ඉතිං දැන් පිට්ටු බම්බුව ගෙනියන්නෙ ?

ගමහාමිනේ : ..............................................................................................................

..............................................................................................................................

ගමරාල : මම ? මම ගෙනාව නම්, ගෙනහුත් දෙන්න ඕන ඔහේ නෙව ?

## චරිතාරෝපිත ව කතා කිරීම.

- උදාහරණය දෙස බලා දී ඇති මාතෘකා වලින් කැමති මාතෘකාවක් තෝරාගෙන චරිතාරෝපිත ලෙස වාක්‍යයක් ලියන්න.

1. ගුරුවරයා - මම දරු දැරියන්ට උගන්වා ඔවුන්ගේ නැණ නුවණ පාදමි.
2. වෛද්‍යවරයා - ..............................................................................................
3. විදුහල්පතිතුමා - ..........................................................................................
4. ලියුම් බෙදන්නා - ..........................................................................................
5. පොලිස් නිලධාරියා - ......................................................................................

- උදාහරණය දෙස බලා දී ඇති මාතෘකා වලින් කැමති මාතෘකාවක් තෝරාගෙන චරිතාරෝපිත කතාවක් ආදර්ශනය සඳහා වාක්‍ය 5ක් ලියන්න.

උදා : මම ගුවන් නියමුවෙක්, මම ලේඛකයෙක්, මම ගොවි මහතෙක්

### මම තොටියෙක්

1. අළුයම අවදි වී ඔරුවට ගොඩ වන මගේ රැකියාවට කාලයක් සීමාවක් නොමැත.
2. මගේ ඔරුවේ සියලු බඩු මුට්ටු පටවාගෙන මිනිසුන්ද නංවාගෙන මම ඔරුව පදින්නෙමි.
3. පාසල් ළමුන්ගෙන් හෝ රෝගී අයගෙන් මම කිසිදා මුදලක් ගෙන එන නැත්තෙමි.
4. ගලා යන සැඩ දිය පහර හරහා ඔරුව පදවා ගෙන එන ආරක්ෂාකර ගැනීම ලෙහෙසි පහසු කාර්යයක් නොවේ.
5. මගේ වෙහෙස මහන්සිය නිවා ගැනීමට උදව් කරන්නේ ගඟ අසබඩ වන ලැහැබෙන් හමා එන සිසිල් සුළඟයි.
6. තොටුපොළට පාළමක් ලැබෙන තුරු මගේ දෑතේ ශක්තියෙන් මම සේවය කරන්නෙමි.

..............................................................................

..............................................................................................................................

..............................................................................................................................

..............................................................................................................................

..............................................................................................................................

..............................................................................................................................

..............................................................................................................................

..............................................................................................................................

# <u>චිත්‍ර කතා.</u>

- පහත චිත්‍ර කතාව කියවා දෙවන චිත්‍ර කතාව සම්පූර්ණ කරන්න.






## පුනරීක්ෂණ

**ඉරි ඇඳි අකුරුවලට යෙදී ඇති පිල්ලම් නම් කරන්න. එම පිල්ලමට අයත් ශබ්දය වරහන තුළ ලියන්න.**

i. රුව පිළිරුව - ........................................................................ ( )

ii. හිරු - ........................................................................ ( )

iii. නැකැත්රාල - ........................................................................ ( )

iv. රෝමය - ........................................................................ ( )

v. ඉත්තෑවා - ........................................................................ ( )

vi. කොහොඹ පත් - ........................................................................ ( )

**සමානාර්ථ පදය වරහන තුළින් තෝරා ලියන්න.**

(පුරාණ, වටිනා, අතීතය, නියමිත, සියවස, වර්ගයේ, දුවන. කෙට්ටු, ළඟ, දුලබ)

i. අනගි - ..........................................

ii. යටගියාව - ..........................................

iii. මාදිලියේ - ..........................................

iv. අසල - ..........................................

v. පැරණි - ..........................................

vi. ශත වර්ෂය - ..........................................

vii. සිහින් - ..........................................

viii. දුර්ලභ - ..........................................

ix. ධාවන - ..........................................

x. නිශ්චිත - ..........................................